# සිංහල



# අනුරූප වචන සංයෝගය

සටහන - ස්වර්ණා විරසිංහ - ගුරු උපදේශක - සිංහල කැලණිය අධ්‍යාපන කලාපය
සැකසුම - ඩබ්.ඩී.දිනේෂා ජයතිස්ස- බප /මිනු /සෙනරත් පරණවිතාන ජාතික පාසල- උඩුගම්පොළ
Copyright © e-thaksalawa.moe.gov.lk

# අනුරූප වචන සංයෝගය

සිංහල භාෂාවේ ලේඛන ව්‍යවහාරයේ දී තත්භව හා තත්සම වචන භාවිත වේ.

තත්සම යනු :- පාලි සංස්කෘත ආදී භාෂාවවල යෙදෙන වචන ඒ අයුරින් ම භාවිත කිරීමයි.

උදා :- ශිල්ප ශාස්ත්‍ර

තත්භව යනු :- පාලි සංස්කෘත ආදී භාෂාවලින් සිංහලයට බිඳී ආ වචනයි.

උදා :- සිප් සතර

මෙහිදී ශිල්ප සතර හෝ සිප් ශාස්ත්‍ර ලෙස භාවිත කිරීම වැරදි සහගත ය.තත්සම වචන ගද්‍යයේදීත් තත්භව වචන පද්‍යයේදීත් භාවිත වේ. පද්‍යට වඩාත් උචිත වන්නේ තත්භව වචනයි.

# අනුරූප වචන සංයෝගය

මෙම පද්‍ය ගායනා කිරීමට සලස්වන්න.

| | | | |
|---|---|---|---|
| ඉඳ | ඉඳ | එක | වෙහෙර |
| විඳ | විඳ | දහම් | මනහර |
| සිඳ | බිඳ | දුක් | සසර |
| අනේ | දෙව්දත් | නොදිටි | මොක්පුර |

# අනුරූප වචන සංයෝගය

| තත්භව | තත්සම |
|---|---|
| වෙහෙර | විහාරය |
| දහම් | ධර්මය |
| මනහර | මනෝහාර |
| දුක් | දුක්ඛ |
| සසර | සංසාර |
| දෙව්දත් | දේවදත්ත |
| මොක්පුර | මෝක්ෂ පුරය |

# අනුරූප වචන සංයෝගය

පහත සඳහන් ආකාරයට මෙවැනි වචන රාශියක් උදාහරණ ලෙස දැක්විය හැකිය.

| තත්සම වචන | තත්භව වචන |
|---|---|
| ධර්ම දේශනාව | දහම් දෙසුම |
| ශාරිපුත්ත මොග්ගල්ලාන | සැරියුත් මුගලන් |
| චන්ද්‍ර මණ්ඩලය | සඳ මඬල |
| උත්තර සාගරය | උතුරු සයුර |
| මාර්ග සංඥා | මග සලකුණු |
| මාතෘ ස්නේහය | මව් සෙනෙහස |

# අනුරූප වචන සංයෝගය

| තත්සම වචන | තත්භව වචන |
| --- | --- |
| ස්ථිර අධිෂ්ඨානය | තිර අදිටන |
| ආදායම් වියදම් | අය වැය |
| මධ්‍යම ප්‍රතිපදාව | මැදුම් පිළිවෙත |
| ශිලා ලේඛනය | සෙල් ලිපිය |
| භාණ්ඩාගාරික | බඩගරික |
| සාහිත්‍ය උත්සවය | සාහිත උළෙල |

# අනුරූප වචන සංයෝගය

| <u>තත්සම වචන</u> | <u>තත්භව  වචන</u> |
|---|---|
| කනිෂ්ඨ විද්‍යාලය | කනිටු විදුහල |
| <u>ජ්‍යේෂ්ඨ</u> පුත්‍රයා | දෙටු පුත් |
| ව්‍යාකරණ විග්‍රහය | වියරණ විධි |
| රංගන ශාලාව | රඟුම් හල |
| අලුත් සහල් මංගල්‍යය | අලුසල් මඟුල |
| පූජා භූමිය | පුද බිම |